# නෛතික අයිතීන් ප්‍රකාශයට පත් කිරීම

## ප්‍රශ්න කරනු ලබන නිදහස් පුද්ගලයකු වෙත සැපයීම සදහා

පොදු ආකෘති පත්‍රය

**පහත සදහන් තොරතුරු ඔබ වෙත ඔබට අවබෝධ කර ගත හැකි භාෂාවකින් ලබා දිය යුතුය.**

ඔබ විසින් වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ වරදක් කිරීමට උත්සාහ දරනු ලැබ ඇති බවට සැක කිරීමට හේතු වන සාධාරණ හේතු එකක් හෝ කිහිපයක් ඔබට එරෙහිව ඇති බැවින් ඔබගෙන් ප්‍රශ්න කරනු ලබන බවට මින් ඔබට දැනුම් දේ.

ඔබ විසින් කරන ලද යැයි චෝදනා කරන ලද වරදේ ස්වභාවය, එය සිදු කරන ලද දිනය හා ස්ථානය දැන ගැනීමට ඔබට අයිතියක් තිබේ.

**ඔබට ඔබගෙන් ප්‍රශ්න කරනු ලබන ස්ථානයෙන් ඕනෑම මොහොතක පිට වී යාමට අයිතිය තිබේ.**

## ඔබට පහත සදහන් දෑ සදහා ද අයිතිය ඇති බව තවදුරටත් දැනුම් දෙනු ලැබේ:

### ප්‍රකාශයක් කිරීමට, ප්‍රශ්නවලට පිළිතුරු දීමට හෝ නිහඬව සිටීමට

ඔබේ අනන්‍යතාව හෙළි කිරීමෙන් පසු, ප්‍රශ්න කිරීම අතරතුර දී ඔබට පහත සදහන් දෑ සිදු කිරීමට තීරණය කළ හැක:

- ප්‍රකාශයන් කිරීම
- අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම
- නිහඬව සිටීම.

### නීතීඥයකුගේ සහාය ලැබීම

ඔබෙන් ප්‍රශ්න කිරීමට හේතු වූ වරද බරපතළ අපරාධයක් හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් ලබා දිය හැකි වරදක් නම්, ඔබෙන් ප්‍රශ්න කිරීමේ දී හෝ නීතිය අභිමුඛයට පමුණුවීමේ දී ඔබට නීතීඥ සහාය ලබා ගත හැකිය.

#### නීතීඥයකු තෝරා ගැනීම

ඔබ අභිමත නීතීඥයකුගේ නෛතික සහාය ලබා ගැනීමට ඉල්ලා සිටීමට ඔබට අයිතියක් තිබේ. ඔබට නීතීඥයකුගේ තොරතුරු සැපයීමට හැකියාවක්

නොමැති නම් හෝ ඔබ අභිමත නීතීඥයාව සම්බන්ධ කර ගත නොහැකි නම් විනිසුරු මණ්ඩලයේ ප්‍රධානියා විසින් නියම කළ, රජයෙන් පත් කරන ලද නීතීඥයකු ඉල්ලා සිටීමට ඔබට හැක.

ඔබට මේ සමග ලැබී ඇති ලියවිල්ලේ ප්‍රකාශ කර ඇති පරිදි, ඔබ විසින් නීති ආධාර ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේ නම් විනා සියලු වියදම් ඔබ විසින් දරනු ලැබිය යුතුය.

### නීතීඥ සහාය

ඔබේ නීතීඥයාට:

- ඔබ සමග සාකච්ඡා කිරීමේ දී රහස්‍යභාවය සහතික කරමින් ඔබට උපදේශකත්වය සැපයිය හැක;
- ඔබෙන් ප්‍රශ්න කරනු ලැබීමේ දී හා ඔබව නීතිය ඉදිරියට පමුණුවීමේ දී ඔබට සහාය සැපයිය හැක.

නීතීඥයකු නොමැතිව ප්‍රශ්න කරනු ලැබීම කරගෙන යාමට ඔබට එකඟ විය හැක.

## භාෂණ පරිවර්තකයකුගේ සහාය ලැබීම

ඔබ ප්‍රංශ භාෂාව කතා නොකරන්නේ නම් හෝ ප්‍රංශ භාෂාව නොදන්නේ නම්, ඔබෙන් ප්‍රශ්න කරනු ලැබීමේ දී, නීතිය ඉදිරියට පමුණුවීමේ දී හෝ නීතීඥයා සමග සාකච්ඡා කිරීමේ දී භාෂණ පරිවර්තකයකුගේ සහාය නොමිලේ ලබා ගැනීමට ඔබට අයිතිය ඇත.

## ඔබේ ජීවිතයේ නිශ්චිත මූලිකාංග වෙත ප්‍රවේශය

ඔබේ හෝ ඔබගේ නීතීඥයාගේ ඉල්ලීමට අනුව, ඔබෙන් ප්‍රශ්න ලැබීමෙන් හෝ නීතිය ඉදිරියට පමුණුවීමෙන් පසු ලබා ගන්නා ලද ප්‍රකාශ සමාලෝචනය කරන ලෙස ඔබට ඉල්ලා සිටිය හැක.

## නෛතික උපදේශනයේ ප්‍රතිලාභ

අදාළ අවස්ථාවන්හි, නීතිය හා සාධාරණත්වය වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සලසන නීති උපදේශන සමාගමකින් මුදල් නොගෙවා නීති උපදේශන ප්‍රතිලාභ ලබා ගැනීමට ඔබට හැක. එම ආයතනයේ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු මේ සමග ඇති ලේඛනයේ සපයා ඇත.